අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Ministery of Education, Higher Education and Vocational Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026

கல்விப் பொது தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - 2026

General Certificate of Education (Advanced Level) Examination - 2026

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය
தமிழ் மொழி மூலம்
Sinhala Medium

භූගෝල විද්‍යාව
Geography
புவியியல்



ප්‍රශ්න පත්‍රය I/II - வினாப்பத்திரம் I/II - Question Paper I/II

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
Ministry of Education, Higher Education and Vocational Education
National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව - 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு - 2026
General Certificate of Education (Advanced Level) Supportive Assessment - 2026

භූගෝල විද්‍යාව - **I**
புவியியல் - **I**
Geography - **I**

22 **S** **I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் - 10 **நிமிடங்கள்**
Additional Reading Time -10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

විභාග අංකය : .....

උපදෙස්:
* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I කොටස** බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* **I කොටසේ** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
* **II** කොටසෙ හි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* **III කොටස** ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරා ගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* **I, II,** සහ **III** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

I කොටස

■ එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **කිත් ඉර මත** ලියන්න.

1. ගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධතියේ (GPS) මෙහෙයුම් මධ්‍යස්ථානයක් වන ඇසෙන්ෂන් දූපත් පිහිටා ඇති සාගරය වන්නේ මින් කුමක් ද?
(1) ආක්ටික් (2) පැසිෆික් (3) ඉන්දියන්
(4) අත්ලාන්තික් (5) ඇන්ටාක්ටික් (.....)

2. දෛශික දත්ත ආකෘතිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය දැක්වෙන වරණය තෝරන්න.
(1) නිරීක්ෂණ ඒකකවලට සංඛ්‍යාත්මක වටිනාකම් ලබා දෙයි.
(2) සිතියම් ප්‍රදේශය පේළි හා තීරු රටාවකට පරිවර්තනය කරයි.
(3) අන්තර්ජාල පින්තූර ඇතුළත් කොට ඇත්තේ දෛශික ආකෘතියෙනි.
(4) හස්තිකව සකස් කරන ලද දත්ත ආකෘතියකි.
(5) ලක්ෂ්‍යය, රේඛා හා කලාප ඇසුරෙන් දත්ත ගබඩා කෙරෙයි. (.....)

3. අනුපාතික ක්‍රමයට සිතියමක පරිමාණය දැක්වීමේ දී,
(1) සෙන්ටි මීටර් පමණක් භාවිත කළ යුතු ය.
(2) සැබෑ භූමියේ ඒකක සහ සිතියමේ ඒකක යන දෙකම භාවිත කළ යුතු ය.
(3) සැබෑ භූමියේ ඒකක පමණක් භාවිත කළ යුතු ය.
(4) කිලෝ මීටර් පමණක් භාවිත කළ යුතු ය.
(5) සිතියම සකස් කරනු ලබන ඒකක පමණක් භාවිත කළ යුතු ය. (.....)

4. සමීක්ෂණයක දී භාවිතයට ගනු ලබන ප්‍රධාන ක්‍රියාවලි දෙකක් වන්නේ,
(1) සම්මුඛ සාකච්ඡා හා දුරකතන සංවාද යි.
(2) නිරීක්ෂණ හා මිනුම් ය.
(3) සෘජු නිරීක්ෂණය හා සහභාගිත්ව නිරීක්ෂණය යි.
(4) ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ය.
(5) නිරීක්ෂණ හා ප්‍රශ්නාවලි ය. (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5. පහත දැක්වෙන විචල්‍යයන් නිරූපණය සඳහා වඩාත් සුදුසු ප්‍රස්තාර වර්ග අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

A - වර්ෂ කිහිපයක යල සහ මහ කන්නවල වී අස්වැන්න


B - වාර්ෂික ආනයන අපනයන සංයුතිය

C - වාර්ෂික වර්ෂාපතන ව්‍යාප්තිය

(1) සරල තීරු-ද්විත්ව තීරු-සරල රේඛා
(2) සක් සටහන-ද්විත්ව තීරු-සම රේඛා
(3) ද්විත්ව රේඛා-සක් සටහන-අපගමන තීරු
(4) ද්විත්ව තීරු-සක් සටහන-සම රේඛා
(5) රේඛාංකිත සිතියම-අපගමන තීරු-විසරණ සටහන

(……)

6. මෙම සමෝච්ච රේඛා සටහනෙන් නිරූපණය කෙරෙන භූ ලක්ෂණය කුමක් ද?



(1) දළ බෑවුම
(2) අවතල බෑවුම
(3) උත්තල බෑවුම
(4) හෙල්වැටිය
(5) සමමිතික බෑවුම

(……)

7. භූ ලක්ෂණ සිතියම් සූචකයේ 'ජලවහන' ශීර්ෂයට අයත් වන ලක්ෂණ පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) වැව - අතු ගංගාව
(2) වාරි ඇල - පාළු වැව
(3) වේල්ල - දිය මංකඩ
(4) දිය ඇල්ල - දිය බෙත්ම
(5) දියවල - ගංගාව

(……)

8. දත්ත වැලක ඉහළ අර්ධය හා පහළ අර්ධය වෙන් කරන ස්ථානය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(1) මධ්‍යස්ථය
(2) මධ්‍යන්‍යය
(3) මධ්‍යන්‍යය අපගමනය
(4) සම්මත අපගමනය
(5) මාතය

(……)

9. 'වැවක් ඉදිකිරීම සඳහා සුදුසු භූමිය සිතියමක් ඇසුරෙන් තෝරා ගැනීම' මෙම ක්‍රියාවලිය අයත් වන සිතියම් පරිහරණ මට්ටම දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සිතියම් කියවීම
(2) සිතියම් අර්ථකථනය
(3) සිතියම් නිර්මාණය
(4) සිතියම් විවරණය
(5) සිතියම්කරණය

(……)

10. කිසියම් මාසයක මිලි මීටර් 75ට වැඩියෙන් වර්ෂාපතනයක් ලැබුණු දින ගණන සෙවීම සඳහා භාවිත කළ හැක්කේ,

(1) සමුච්චිත සංඛ්‍යාතය යි.
(2). සංඛ්‍යාතය යි.
(3) මධ්‍යන්‍යය අපගමනය යි.
(4) සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය යි.
(5) සම්මත අපගමනය යි.

(……)

11. භාෂ්මික ආග්නේය පාෂාණ වර්ගයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඩයොරයිට්
(2) ගැබ්‍රෝ
(3) ඇන්ඩිසයිට්
(4) ග්‍රැනයිට්
(5) ඔබ්සිඩියන්

(……)

12. සූර්ය ශක්තිය හා භෞතික ක්‍රියාවලි මත පමණක් සිදු වන චක්‍රයක් වන්නේ මින් කුමක් ද?

(1) කාබන් චක්‍රය
(2) ඔක්සිජන් චක්‍රය
(3) ජල චක්‍රය
(4) නයිට්‍රජන් චක්‍රය
(5) පොස්ෆරස් චක්‍රය

(……)

13. ග්‍රීට්, වානෝකයිට්, හුණුගල් යන පාෂාණ වර්ග, ශ්‍රී ලංකාවේ බහුලව ම දක්නට ලැබෙන ප්‍රදේශ තුනක් නිවැරදිව අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) මුතුරාජවෙල - යාපනය - ආඩිගම
(2) අකුරුකඩුව - රක්වාන - යාපනය
(3) ආඩිගම - හපුතලේ - අකුරුකඩුව
(4) බුළුතොට - ආඩිගම - රක්වාන
(5) තබ්බෝව - බුළුතොට - හපුතලේ

(……)

14. තැටි භූ කාරක කල්පිතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) භූ තැටි අධෝගෝලය මත සෙමෙන් චලනය වේ.
(2) භූ තැටි ස්ථාවර වන අතර ඒවා චලනය නොවේ.
(3) කබොල මත ඒකාකාරී ව විහිදී ඇත.
(4) සූර්ය තාපයේ වෙනස් වීම් නිසා භූමි කම්පාවන් සිදු වේ.
(5) නිර්මාණාත්මක තැටි මායිම් ආශ්‍රිත ව නැමී කඳු නිර්මාණය වේ. (……)

15. පාෂාණ ස්තරවල උඩු නැමී හා යටි නැමීවල මැග්මා තැන්පත් වීමෙන් නිර්මාණය වන භූ රූපයක් වන්නේ මින් කුමක් ද?
(1) ලැකොලිත (2) ආස්තර (3) පාකොලිත
(4) ලොපොලිත (5) බැතොලිත
(.....)


16. වෙරළට වදින රළ පහර, ඉදිරියට එන තරංගයට යටින් ආපසු ඇදී යාමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,
(1) පිළිසෝදාව නමින් ය. (2) සංඝර්ෂණය නමින් ය. (3) අවලම්බනය නමින් ය.
(4) ද්‍රාව ක්‍රියාව නමින් ය. (5) අනු තීර ජ්ලාවිතය නමින් ය.
(.....)

17. 2025 නොවැම්බර් ඇති වූ 'සෙන්යාර්' (Senyar) සුළි කුණාටුව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය දැක්වෙන වරණය තෝරන්න.
(1) බෙංගාල බොක්ක ආශ්‍රිත ව නිර්මාණය වී ශ්‍රී ලංකාවට බලපෑම් ඇති කළේ ය.
(2) පැසිෆික් සාගර කලාපයේ ඇති වූ ප්‍රබල සුළි සුළඟක් වේ.
(3) බෙංගාල බොක්ක ආශ්‍රිත ව පමණක් ක්‍රියාත්මක ව තිබූ අතර ගොඩබිම්වලට බලපෑම් ඇති නොකළේ ය.
(4) දකුණු තායිලන්තය, මලය අර්ධද්වීපය හා සුමාත්‍රා දිවයිනට දැඩි වැසි හා හානි ඇති කළේ ය.
(5) අරාබි මුහුදු ආශ්‍රිත ව නිර්මාණය වී ශ්‍රී ලංකාවට බලපෑම් ඇති කළ ප්‍රබල සුළි කුණාටුවක් වේ. (.....)

18. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගංගාවල ප්‍රධාන ගැටලුවක් වන්නේ මින් කුමක් ද?
(1) ගංගාවන් මුහුදට ගලා යාමට පෙර වියළී යාම (2) ජලය රඳවා ගැනීමට ජලාශ නොමැති වීම
(3) වර්ෂාපතනය වැඩි වීම නිසා ජල ගැලීම් ඇති වීම (4) වර්ෂාපතනයට සාපේක්ෂ ව අපධාවය වැඩි වීම
(5) වැසි අඩු වීම හා වියළි කාලය දිගු වීම
(.....)

19. දේශගුණ වෙනස් වීම් පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ (IPCC) වාර්තා අනුව 1906-2005 කාලය තුළ ගෝලීය උෂ්ණත්වය කොපමණ ප්‍රමාණයකින් වැඩි වී ඇත් ද?
(1) 0.5^0 C (2) 0.74^0 C (3) 1.0^0 C (4) 1.5^0 C (5) 2.1^0 C
(.....)

20. මෙම සිතියමෙහි A, B, C ලෙස නම් කර ඇති බියෝම වර්ග නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.



(1)	A - නිවර්තන වර්ෂා වනාන්තර	B - කාන්තාර	C - තුන්ද්‍රා
(2)	A - කාන්තාර	B - තුන්ද්‍රා	C - සැවනා
(3)	A - කාන්තාර	B - සැවනා	C - නිවර්තන වර්ෂා වනාන්තර
(4)	A - නිවර්තන වර්ෂා වනාන්තර	B - සැවනා	C - කාන්තාර
(5)	A - තෘණ භූමි	B - කාන්තාර	C - තුන්ද්‍රා

(.....)

21. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ජාතික සභාව ක්‍රියාත්මක වනුයේ,
(1) ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ය.
(2) පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ය.
(3) මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ ය.
(4) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ය.
(5) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ ය. (.....)

22. ස්වභාවධර්මය සංරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සංගමය (IUCN) මගින් සම්පාදනය කරනු ලබන රතු දත්ත පොත (Red List Book) මගින් දක්වනු ලබන්නේ,
(1) වනාන්තර හායනය පිළිබඳ ව ය.
(2) සාගර ජල මට්ටම ඉහළ යාම පිළිබඳ ව ය.
(3) ජාත්‍යන්තර මූල්‍ය අර්බුදයන් පිළිබඳ ව ය.
(4) අවදානමට ලක් වූ ශාක හා සත්ත්ව ප්‍රජාවන් පිළිබඳ ව ය.
(5) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පිළිබඳ ව ය. (.....)

23. තෙත් බිම් ආශ්‍රිත අභය භූමි දෙකක් දැක්වෙන වරණය තෝරන්න.
(1) බුන්දල - මාදු ගඟ (2) කුමන - බුන්දල (3) කොග්ගල - කුමන
(4) ආනවිලුන්දාව - කුමන (5) මාදු ගඟ - හග්ගල
(.....)

24. මුහුදු මට්ටමේ දී වායුගෝලයේ සාමාන්‍ය පීඩනය මිලිබාර් (mb),
(1) 300 කි. (2) 1013 කි. (3) 1025 කි.
(4) 1040 කි. (5) 1130 කි.
(.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

25. උප නිවර්තන වැඩි පීඩන කලාපවල සිට සමක අඩු පීඩන කලාපය වෙත සංසරණය වන ප්‍රාථමික සුළං වර්ගය මින් කුමක් ද?
(1) මෝසම් සුළං (2) බටහිර සුළං (3) කඳු හා නිම්න සුළං
(4) ධ්‍රැවක සුළං (5) වෙළඳ සුළං
(……)

26. දළ උපත් අනුපාතිකය මගින් ගණනය කරනුයේ,
(1) රටක ජනගහනයෙන් අලුත උපන් බිලිදුන් ප්‍රමාණය කොපමණ ද යන්න යි.
(2) මධ්‍ය වාර්ෂික ජනගහනයට සාපේක්ෂව දළ උපත් වල ප්‍රතිශතය යි.
(3) ප්‍රදේශයක පුද්ගලයින් දහසකට සාපේක්ෂව සිදුව ඇති ස්වාභාවික වර්ධනය යි.
(4) මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් පුද්ගලයින් දහසකට සිදු වූ සජීවී උපත් සංඛ්‍යාව යි.
(5) මධ්‍ය වාර්ෂික ජනගහනයට සාපේක්ෂව සිදුව ඇති උපත් සංඛ්‍යාව යි. (……)

27. 'නිහැඩ' ජනාවාස යනු මොනවාද?
(1) කිසියම් ආකාරයක නිශ්චිත හැඩයකින් යුතු ජනාවාස ය.
(2) කිසියම් ලක්ෂ්‍යයක් කේන්ද්‍ර කර ගනිමින් වර්ධනය වූ ජනාවාස ය.
(3) කිසිදු බාධාවකින් තොරව ව්‍යාප්ත වූ ජනාවාස ය.
(4) විධිමත් සැලැස්මකට අනුව නිර්මාණය වූ ජනාවාස ය.
(5) අක්‍රමවත් ව නිර්මාණය වූ ජනාවාස ය. (……)

28. ගැමි නාගරික ජනාවාස වල ප්‍රධාන ලක්ෂණ දෙකක් සහිත පිළිතුර කුමක් ද?
(1) නේවාසික ප්‍රදේශ බහුල වීම සහ දෛනික සචලතාව ඉහළ වීම
(2) කෘෂි බිම් බහුල වීම සහ කාර්මික ප්‍රදේශ පුළුල් වීම
(3) දෛනික සචලතාව අවම වීම සහ ස්වයං රැකියා බහුල වීම
(4) ශබ්ද දූෂණය වර්ධනය වීම සහ අපචාර ඉහළ යාම
(5) නේවාසික ප්‍රදේශ අවම වීම සහ අවිධිමත් ජනාවාස බහුල වීම (……)

29. 'ශ්‍රී ලංකාවේ නාගරීකරණ මට්ටම' පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලොව අවම නාගරීකරණයක් සහිත රටකි.
(2) නාගරීකරණ මට්ටම ක්‍රමයෙන් උච්චාවචනය වේ.
(3) නගර ආශ්‍රිත වෙනස්කම් ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.
(4) සැබෑ නාගරීකරණ මට්ටම හෙළි වී නොමැත.
(5) යටිතල පහසුකම් අවම මට්ටමක පවතී. (……)

30. ලෝකයේ ජාන තාක්ෂණය හා සම්බන්ධ කටයුතු ආරම්භ වූයේ යැයි සැලකෙන වර්ෂය මින් කුමක් ද?
(1) 1943 (2) 1962 (3) 1973 (4) 1985 (5) 1994
(……)

31. වර්තමාන ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ගයක් ලෙස වර්ධනය වෙමින් පවතින ක්ෂේත්‍ර දෙක දැක්වෙන වරණය තෝරන්න.
(1) සංචාරක කර්මාන්තය සහ ස්වයං රැකියා (2) සංචාරක කර්මාන්තය සහ සෘජු විදේශ ආයෝජන
(3) විදේශ ආයෝජන සහ මෝටර් රථ අපනයනය (4) විදේශ රැකියා සහ සාම්ප්‍රදායික භෝග අපනයනය
(5) මෝටර් රථ සහ ඖෂධ අපනයනය
(……)

32. කතරගම ප්‍රදේශය අයත් වන සංචාරක ප්‍රභේදය නිවැරදිව දක්වා ඇති වරණය මින් කුමක් ද?
(1) වික්‍රමයන් ආශ්‍රිත සංචරණය (2) සෞන්දර්යය ආශ්‍රිත සංචරණය
(3) ප්‍රතිමෝදක සංචරණය (4) ඓතිහාසික සංචරණය
(5) පාරිසරික සංචරණය
(……)

33. පසු අස්වනු තාක්ෂණයට අදාළ <u>නොවන</u> කරුණක් සහිත පිළිතුර තෝරන්න.
(1) ඇසුරුම් සඳහා ප්‍රමිතිගත කූඩ භාවිතය (2) විධිමත් ගබඩා කරන පහසුකම් ඇති කිරීම
(3) කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රම භාවිතය (4) ප්‍රවාහනය සඳහා ශීතාගාර සහිත වාහන භාවිතය
(5) ප්‍රවාහනයේ දී විනාශ නොවන භෝග හඳුන්වා දීම
(……)

34. කාබන් ප්‍රතිශතය 90%ට වඩා ඉහළ ගල් අඟුරු හඳුන්වනු ලබන්නේ,
(1) ප්‍රජතු යනුවෙනි. (2) ජීර්ණක යනුවෙනි. (3) ලිමොනයිට් යනුවෙනි.
(4) ජතු යනුවෙනි. (5) කාෂ්ඨික යනුවෙනි.
(……)

35. සංක්‍රමණ සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වයට බලපෑම් කරයි.
(2) ජන සංඛ්‍යාවේ වර්ධනයට බලපානු ලබන මූලික සාධකයකි.
(3) නාගරීකරණය තීරණය කරනු ලබන සාධකයකි.
(4) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ගතිකත්වය තීරණය කරයි.
(5) ඇද ගැනීමේ සහ තල්ලු කිරීමේ සාධක මත තීරණය වේ. (.....)

36. කප්පි ක්‍රමය, ආඩියා ළිඳ, දිය රෝදය සහ විවිධ පොම්ප වර්ග භාවිතය මගින් සිදු කෙරෙන ජල සම්පාදන ක්‍රම හඳුන්වන නාමය සහිත වරණය තෝරන්න.
(1) විසිරි ජල සම්පාදන ක්‍රමය (2) පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමය (3) ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමය
(4) උස්සාන වාරිමාර්ග ක්‍රමය (5) ගුරුත්ව වාරිමාර්ග ක්‍රමය
(.....)

37. නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක අතුරින්, ජපානයේ ටෝකියෝ, නගෝයා සහ කෝබේ ප්‍රදේශවල යකඩ හා වානේ කර්මාන්ත ස්ථාන ගත වීමට බලපා ඇති සාධකය කුමක් ද?
(1) ප්‍රාග්ධනය (2) තාක්ෂණය (3) ප්‍රවාහනය
(4) ශ්‍රමය (5) බලශක්තිය
(.....)

38. නිෂ්පාදන ක්ෂේත්‍රයේ පරිමාව සහ ගුණාත්මකභාවය වර්ධනයට කාර්මික විප්ලවය බලපෑම් කරන ලද්දේ,
(1) රැකියා අවස්ථා පුළුල් කිරීම මගින් ය.
(2) කාන්තාවන් වැඩි වශයෙන් ශ්‍රම බලකායට යොමු කරවා ගැනීම මගින් ය.
(3) නිෂ්පාදන කර්මාන්ත විවිධාංගීකරණය මගින් ය.
(4) සාම්ප්‍රදායික කර්මාන්ත සංරක්ෂණය මගින් ය.
(5) නිෂ්පාදන ක්‍රියාවලියට යන්ත්‍රෝපකරණ යොදා ගැනීම මගින් ය. (.....)

39. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) පෙන්වා දෙන ගෝලීයකරණය සිදු වන මූලික අංශ පමණක් දැක්වෙන වරණය කුමක් ද?
(1) දැනුම බෙදා හැරීම, ප්‍රාග්ධනය හා ආයෝජනය, අධ්‍යාපනය
(2) අධ්‍යාපනය, වෙළඳාම හා ගනුදෙනු කිරීම, සංක්‍රමණය
(3) වෙළඳාම හා ගනුදෙනු කිරීම, ප්‍රාග්ධනය හා ආයෝජනය, දැනුම බෙදා හැරීම
(4) වෙළඳාම හා ගනුදෙනු කිරීම, ප්‍රාග්ධනය හා ආයෝජනය, අධ්‍යාපනය
(5) අධ්‍යාපනය, සංක්‍රමණය, දැනුම බෙදා හැරීම (.....)

40. සාර්ක් (SAARC) සංවිධානය නිල වශයෙන් ආරම්භ කළ නගරය කුමක් ද?
(1) නව දිල්ලිය (2) ඩකා (3) කොළඹ
(5) තිම්පු (5) කරච්චි
(.....)

❋ ❋ ❋ ❋

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Advanced Level) Supportive Assessment, 2026

භූගෝල විද්‍යාව - **I**
புவியியல் - I
Geography - **I**

22 **S** **I**

II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැලකිය යුතුයි:
* **ප්‍රශ්නයට අදාළ අංකය** සහ **උප කොටස්වල අංකය** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
* **පිළිතුරු භූ ලක්ෂණ සිතියමෙහි ලිවිය යුතු නොවේ.**
* සපයා ඇති භූ ලක්ෂණ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නොවේ.**

(i) **A** අක්ෂරයෙන් දක්වා ඇති භූ විෂමතා ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01)

(ii) **B** අක්ෂරයෙන් දක්වා ඇති ජලවහන ලක්ෂණය කුමක් ද? (ලකුණු 01)

(iii) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන මායිම් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(iv) **C** හා **D** අක්ෂරවලින් නම් කර ඇති ලක්ෂණ **දෙක** නම් කරන්න. (ලකුණු 02)

(v) සිතියම් ප්‍රදේශයේ බහුල ව ව්‍යාප්ත වී ඇති ව්‍යාපාරික බෝගය නම් කරන්න. (ලකුණු 01)

(vi) සිතියම් ප්‍රදේශයේ වී වගාවේ ව්‍යාප්තිය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇති සාධකය නම් කරන්න. (ලකුණු 01)

(vii) **E** චතුරස්‍රය දෙගුණයකින් විශාල කර එහි ඇති ගංගාව හා මාර්ග ඇඳ දක්වන්න. (ලකුණු 04)

(viii) විශාල කරන ලද චතුරස්‍රය තුළ ඇති අප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර්වලින් දක්වන්න. (ලකුණු 02)

(ix) සමස්ත සිතියම් ප්‍රදේශයේ භූ විෂමතාව ආශ්‍රිත කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

2. සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් මතු සඳහන් දෑ සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි **ලකුණු කර නම් කරන්න**.

- පර්සියන් බොක්ක
- වෙනිසියුලාව
- යුරල් කඳු
- යැංසිකියැං ගඟ
- කර්කටක නිවර්තනය
- ප්‍රෙයරීස් තෘණ භූමිය
- අයර් විල
- බෝෆට් මුහුදු
- වර්තමානයේ අප්‍රිකානු රටවල් අතර විශාලතම පෙට්‍රෝලියම් නිෂ්පාදක රාජ්‍යය
- 2026 ලෝක ආර්ථික සමුළුව (WEF) පැවැත්වූ නගරය (ලකුණු 10)

III කොටස

3.

(i). සිතියමක අන්තර්ගත තොරතුරු අනුව ප්‍රධාන සිතියම් වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02)

(ii). ඔබ ඉහත (i) හි නම් කළ එක් සිතියම් වර්ගයක ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii). ද්විතීයික දත්ත මූලාශ්‍රයක් ලෙස සිතියම් භාවිතයේ දී පර්යේෂකයෙකුට මතු විය හැකි ගැටලු **දෙකක්** සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iv). 'දිට්වා' සුළි කුණාටුව මගින් ශ්‍රී ලංකා ජන සමාජයට ඇති කරන ලද බලපෑම පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට දත්ත ලබා ගත හැකි ආයතනික මූලාශ්‍ර **තුනක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

4.

(i). දුරස්ථ සංවේදය යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(ii). දුරස්ථ සංවේද ක්‍රියාවලියේ පහත දැක්වෙන අවස්ථා **තුනෙහි** ක්‍රියාකාරිත්වය කෙටියෙන් විස්තර කරන්න.

a. ශක්ති ප්‍රභවය
b. ඉලක්කය හෝ වස්තුව
c. විශ්ලේෂණය (ලකුණු 03)

(iii). ගුවන් ඡායාරූප තාක්ෂණයේ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04)

(iv). ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා නව සිතියම් විද්‍යාත්මක ක්‍රම-ශිල්ප යොදා ගත හැකි අවස්ථා **තුනක්** නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

5. 2021 – 2024 කාල පරිච්ඡේදයේ කලාප මට්ටමින් ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම වගුව 1 හි දැක්වේ.

වගුව 1 : **කලාප අනුව ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීම (දහස්)** (2021 - 2024)

වර්ෂය	යුරෝපය	ආසියා-පැසිෆික්	මැදපෙරදිග	ඇමෙරිකා
2021	450	620	180	210
2022	780	920	260	300
2023	1050	1300	420	510
2024	1200	1500	500	600

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2025

(i). දත්ත වගුව 1 භාවිත කර **බහු-තීරු ප්‍රස්තාරයක්** නිර්මාණය කරන්න. (ලකුණු 08)

(ii). ඔබ විසින් නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරින් කලාපීය මට්ටමින් සංචාරකයින්ගේ පැමිණීමේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(iii). නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරින් බහු තීරු ප්‍රස්තාර ක්‍රමයේ වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 03)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

6. **වගුව 2** හි දක්වා ඇති දත්ත භාවිත කරමින් මතු සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 2 : මහ කන්නයේ වී නිෂ්පාදනය (මෙ.ටො. දහස්) 2016 - 2025

වර්ෂය	නිෂ්පාදනය (මෙ.ටො - දහස්)
2016	2,903
2017	1,474
2018	2,397
2019	3,072
2020	3,197
2021	3,062
2022	1,931
2023	2,696
2024	2,722
2025	2,746

මූලාශ්‍රය:- ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2025

(i). **වගුව 2** හි ඇති දත්ත අනුව මහ කන්නයේ වාර්ෂික වී අස්වැන්න හා සම්බන්ධ පහත ගණනය කිරීම් සිදු කරන්න.

a. මධ්‍යන්‍යය
b. අපගමනය
c. මධ්‍යන්‍යය අපගමනය

$MD = \sum \frac{|x-\bar{x}|}{n}$ සූත්‍රය භාවිත කරන්න (ලකුණු 05)

(ii). ඉහත (i) හි දත්ත වගුව ඇසුරින් **අපගමන ප්‍රස්තාරයක්** නිර්මාණය කරන්න. (ලකුණු 06)

(iii). ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ඇසුරින් ශ්‍රී ලංකාවේ මහ කන්නයේ වාර්ෂික වී නිෂ්පාදනයේ විචලතාවය පිළිබඳ කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04)

❋ ❋ ❋ ❋

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Advanced Level) Supportive Assessment, 2026

භූගෝල විද්‍යාව - **II**
புவியியல - **II**
Geography - **II**

22 **S** **II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்

අමතර කියවීම් කාලය - මිනිත්තු **10**යි
மேலதிக வாசிப்பு நேரம் - 10 **நிமிடங்கள்**
Additional Reading Time -10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්:
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක් වත්** තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1.

(i). භෞතික පද්ධතියක ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)

(ii). ශිලාගෝලීය පද්ධතියේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iii). පහත උප පද්ධති ආශ්‍රිතව දක්නට ලැබෙන ස්වාභාවික ක්‍රියාවලි **එක** බැගින් සාකච්ඡා කරන්න.
a. ජලගෝලය b. වායුගෝලය c. ජෛවගෝලය (ලකුණු 6)

(iv). පාරිසරික සමතුලිතතාව බිඳ වැටෙන භෞතික හා මානව ක්‍රියාවලි **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

2.

(i). ග්ලැසියර් ආශ්‍රිත බාදන ක්‍රියාවලි **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)


(ii). ඇල්පයින් ග්ලැසියර් ආශ්‍රිත බාදිත භූ රූප **තුනක** නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

(iii). මහතලා ග්ලැසියර් ආශ්‍රිත නිධිසාදිත භූ රූප **තුනක්** රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

(iv). වර්තමානයේ ග්ලැසියර් ආශ්‍රිත ප්‍රදේශ මුහුණ පා ඇති ගැටලු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)

3.

(i). පෘථිවිය මතුපිට ජල ව්‍යාප්තිය හා සම්බන්ධ මෙම සටහනෙහි A හා B නම් කරන්න. (ලකුණු 2)



(ii). ජලය සම්පතක් වීමට බලපාන සාධක **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iii) සාගර ජලය භාවිතයෙන් සිදු කරන ආර්ථික කටයුතු **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iv). ගෝලීය වශයෙන් පවතින ජල ගැටලු අවම කිරීමට විවිධ රටවල් භාවිත කරන නව ක්‍රමවේද **තුනක** යෝග්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 6)

4.

(i). උණුසුම් කාන්තාර හා ශීත කාන්තාර **දෙක** බැගින් නම් කරන්න. (ලකුණු 2)

(ii). කාන්තාර බියෝම පද්ධතියේ ලක්ෂණ **තුනක්** පහත සාධක යටතේ විස්තර කරන්න.
a. ව්‍යාප්තිය b. දේශගුණය c. වෘක්ෂලතා (ලකුණු 6)

(iii) වර්තමානයේ කාන්තාරීකරණය වර්ධනය කිරීමට හේතු වී ඇති මානව ක්‍රියාකාරකම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)

(iv). මෑත කාලයේ නිරන්තරයෙන් සිදු වන ජල ගැලීම් නිසා ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති මුහුණ පා ඇති ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5.

(i). දරිද්‍රතාවෙහි බහුමාන ගති ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 2)

(ii). ලෝක දරිද්‍රතාවට බලපාන හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iii). රටක ආහාර සුරක්ෂිතතාව රඳා පවතින ප්‍රධාන අංශ **තුන** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iv). ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

6.

(i). පෙට්‍රෝලියම් ආශ්‍රිත අතුරු නිෂ්පාදන **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)

(ii). පහත වගුවට අනුව ගෝලීය පෙට්‍රෝලියම් නිෂ්පාදනයේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

පෙට්‍රෝලියම් නිෂ්පාදනය - දිනකට බැරල් (මිලියන)

කලාපය	2020	2021	2022	2023	2024	2025
අප්‍රිකාව	7.2	7.2	7.0	7.1	7.2	7.4
ලතින් ඇමරිකාව	5.9	6.0	6.4	7.0	7.4	7.7
උතුරු ඇමරිකාව	24.2	24.3	25.8	27.6	28.3	28.9
චීනය	3.9	4.0	4.1	4.2	4.3	4.4
සෙසු ආසියාව	3.4	3.3	3.2	3.1	3.1	3.0
යුරෝපය	3.5	3.3	3.2	3.3	3.3	3.4
මැදපෙරදිග	27.7	28.2	30.9	30.7	30.2	30.6
මුළු නිෂ්පාදනය	**75.8**	**76.3**	**80.6**	**83.0**	**83.8**	**85.4**

මූලාශ්‍රය : Annual Statistical Bulletin (World Crude Oil Production Data), 2026

(iii). පෙට්‍රෝලියම් නිෂ්පාදනය ආශ්‍රිතව ගෝලීය වශයෙන් පැන නැඟී ඇති ගැටලු **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iv). ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් භාවිතය සම්බන්ධ ගැටළු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 6)

7.

(i). ජාන තාක්ෂණය යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 2)

(ii). ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ජාන තාක්ෂණය භාවිත කිරීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 6)

(iii). වර්තමානයේ එෙන්ද්‍රීය කෘෂිකර්මාන්තය කෙරෙහි ක්‍රමයෙන් නැඹුරු වීම සඳහා බලපා ඇති සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)

(iv). ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදන අලෙවිකරණ ක්‍රියාවලියේ පවතින ගැටලු විසඳා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 6)

8.

(i). කලාපීය සංවිධානයක් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 2)

(ii). සාර්ක් (SAARC) සංවිධානයේ අරමුණු හා කාර්යය භාරයන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)

(iii). වර්තමානය වන විට සාර්ක් සංවිධානය මුහුණ පා ඇති අභියෝග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)


(iv). සංවර්ධනය වෙමින් පවතින රටකට ආපදා කළමනාකරණය සඳහා ජාත්‍යන්තර සංවිධානවල දායකත්වය පිළිබඳ කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)

❋ ❋ ❋ ❋

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

22 I



1:50,000

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education


අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

ප්‍රශ්න අංකය : 2

විභාග අංකය : .....

භූගෝල විද්‍යාව I

22 **I**



අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Ministry of Education, Higher Education and Vocational Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026

கல்விப் பொது தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - 2026

General Certificate of Education (Advanced Level) Examination - 2026

උපකාරක තක්සේරුව	- පිළිතුරු පත්‍රය
உதவி மதிப்பீடு	- விடைப்பத்திரம
Supportive Assement	- Answer Sheet

සිංහල මාධ්‍යය
தமிழ் மொழி மூலம்
Sinhala Medium

භූගෝල විද්‍යාව
புவியியல்
Geography



පිළිතුරු පත්‍රය - விடைப்பத்திரம் - Answer Sheet

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
Ministry of Education, Higher Education and Vocational Education
National Languages and Humanities Branch

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Advanced Level) Supportive Assessment, 2026

භූගෝල විද්‍යාව - I - (පිළිතුරු පත්‍රය)
புவியியல - I - (விடைப்பத்திரம்)
Geography - I - (Answer Sheet)

22 S I

I කොටස

01	**4**	11	**2**	21	**5**	31	**2**
02	**5**	12	**3**	22	**4**	32	**3**
03	**5**	13	**3**	23	**1**	33	**5**
04	**4**	14	**1**	24	**2**	34	**1**
05	**4**	15	**3**	25	**5**	35	**1**
06	**5**	16	**1**	26	**4**	36	**4**
07	**2**	17	**4**	27	**5**	37	**3**
08	**1**	18	**5**	28	**1**	38	**5**
09	**2**	19	**2**	29	**4**	39	**3**
10	**1**	20	**3**	30	**3**	40	**2**

(ලකුණු1 x 40 - ලකුණු40)

II කොටස

1).

(i) A - රළි බිම **(ලකුණු 1)**

(ii) B - ගං දහරය **(ලකුණු 1)**


(iii) - පළාත් මායිම
- දිස්ත්‍රික්ක මායිම **(මායිම් වර්ග දෙක නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

(iv) C - දුම්රිය නැවතුම
D - දුම්රිය පොළ **(ලකුණු 1 බැගින් - ලකුණු 2)**

(v) රබර් **(ලකුණු 1)**

(vi) ගංගාව / අතු ගංගාව / ගංගා පිටාර තැනි / ගංගා නිම්න **(මින් එකක් නම් කිරීමට - ලකුණු 1)**

(vii)




චතුරස්‍රය නිවැරදිව ඇඳීමට (4cm x 4cm)	ලකුණු 01
මාර්ග සියල්ල නිවැරදිව ඇඳීමට	ලකුණු 01
ගංගාව නිවැරදිව ඇඳීමට	ලකුණු 01
1:25,000 පරිමාණය දැක්වීමට	ලකුණු 01
	(ලකුණු 04)

(viii) අප්‍රධාන මාර්ගයේ සැබෑ දිග 1km කි
(සිතියම මුද්‍රණයේ දී පරිමාණය වෙනස් විය හැකි බැවින් ගණනය කර ලකුණු ලබා දෙන්න) **(ලකුණු 2)**

(ix) - වැඩි වශයෙන් කඳුවැටි ව්‍යාප්ත ව තිබීම
- සිතියම් ප්‍රදේශය නැගෙනහිර සිට බටහිර දෙසට බෑවුම් වේ
- සිතියම් ප්‍රදේශය මීටර 400 ට වැඩි උසක් දක්වා විවිධත්වයකින් යුක්ත වීම
- සිතියම් ප්‍රදේශයේ අවම උසක් දක්වන්නේ නිරිත කාර්තුවයි
- උතුරු අර්ධයේ මධ්‍යයට වන්නට රළි බිම් ව්‍යාප්ත ව තිබීම

(යනාදි කරුණු තුනක් වත් විස්තර කර තිබිය යුතුය - ලකුණු 6)

2). පිළිතුරු සිතියම



(ලකුණු 1 බැගින් - ලකුණු10)

III කොටස

3. **i.** සිතියමක අන්තර්ගත තොරතුරු අනුව ප්‍රධාන සිතියම් වර්ග **දෙක** නම් කරන්න.

- තේමා සිතියම්
- භූ ලක්ෂණ සිතියම්

(නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)

ii. ඔබ ඉහත (i) හි නම් කළ එක් සිතියම් වර්ගයක ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

- **තේමා සිතියම්**
- සුවිශේෂී එක් තේමාවක් නිරූපණය කරයි
- නිරූපණය කරන විචල්‍ය මත සිතියමේ මාතෘකාව තීරණය වේ
- සිතියම් නිර්මාණය කරන්නා මත භාවිත වන වර්ණ, සංකේත හා අක්ෂර වෙනස් වේ
- තනි තේමාවක් නිරූපණය කරන බැවින් සරල සිතියමකි
- අවශ්‍යතාවය පරිදි විවිධ පරිමාණයන් මත නිර්මාණය වූ සිතියම් පවතී

- **භූ ලක්ෂණ සිතියම්**
- සිතියම් ගත ප්‍රදේශයේ පරිමාණය හා භෞතික ලක්ෂණ නිරූපණය කරයි
- සිතියමේ පරිමාණ ශ්‍රේණිය මත සිතියමේ නම/වර්ගය තීරණය වේ
- සම්මත වර්ණ, සංකේත හා අක්ෂර භාවිත කරයි
- සාපේක්ෂව තරමක් විශාල සිතියමක් වේ
- සිතියම් ශ්‍රේණියක් මත නිර්මාණය කරයි
- භෞතික හා සංස්කෘතික ලක්ෂණ නිරූපණය කරයි
- කිසියම් ප්‍රදේශයක සමස්ත භූ දර්ශනය නිරූපණය කරයි

(යනාදි එක් වර්ගයක ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 3)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

iii. ද්විතීයික දත්ත මූලාශ්‍රයක් ලෙස සිතියම් භාවිතයේ දී පර්යේෂකයෙකුට මතු විය හැකි ගැටලු **දෙකක්** සාකච්ඡා කරන්න.

- දත්ත පැරණි වීම – සිතියම සකස් කළ කාලයෙන් පසුව භූමියෙහි වෙනස්කම් සිදු වී තිබිය හැකි බැවින්
- පරිමාණය (Scale) සීමිත වීම – සිතියමේ පරිමාණය අනුව විස්තරාත්මක තොරතුරු සම්පූර්ණයෙන් පෙන්වන්නේ නැති වීම
- නිරවද්‍යතාවයේ අඩු වීම – සමහර සිතියම්වල දුර, ප්‍රමාණ හෝ ස්ථාන නිවැරදි නොවිය හැක
- තොරතුරු සීමිත වීම – සිතියමක් එක් විෂයයක් හෝ කිහිපයක් පමණක් පෙන්වීම නිසා අවශ්‍ය සියලු තොරතුරු ලබාගැනීමට නොහැකි විය හැක
- සංකේත හා ලකුණු තේරුම් ගැනීමේ අපහසුතා – සිතියම් සංකේත, වර්ණ හා ලකුණු නිවැරදිව පැහැදිලි නොවීමෙන් දත්ත වැරදි ලෙස විග්‍රහ විය හැක
- ප්‍රක්ෂේපණ දෝෂ (Projection errors) – පෘථිවිය වටකුරු බැවින් එය සෘජු තලයකට පරිවර්තනය කිරීමේදී විකෘතිතා ඇති වීම
- සම්පාදක පක්ෂපාතීභාවය – සිතියම සකස් කළ පුද්ගලයාගේ හෝ ආයතනයේ අරමුණු අනුව තොරතුරු තෝරා පෙන්වා තිබිය හැක
- සිතියම් යාවත්කාලීන නොවීම – නව මාර්ග, නගර, වනාන්තර වෙනස්වීම් වැනි දේ සිතියම තුළ නොපෙන්වා තිබිය හැක

(ගැටළු දෙකක් සාකච්ඡා කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 4)

iv. 'දිවිවා' සුළි කුණාටුව මගින් ශ්‍රී ලංකා ජන සමාජයට ඇති කරන ලද බලපෑම පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට දත්ත ලබා ගත හැකි ආයතනික මූලාශ්‍ර **තුනක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

- ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය
    - ආපදා වාර්තා, හානි වාර්තා, සහ ආපදා කළමනාකරණ තොරතුරු
- කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
    - සුළි කුණාටුවේ ගමන් මාර්ගය, වැසි ප්‍රමාණය, සුළං වේගය වැනි කාලගුණ දත්ත
- අධ්‍යයන ප්‍රදේශයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / අදාළ නගර හා ප්‍රාදේශීය සභා
    - ප්‍රාදේශීය මට්ටමේ හානි හා ජනතාවට ඇති වූ බලපෑම් පිළිබඳ දත්ත
- ශ්‍රී ලංකා පොලිසිය
    - මරණ, අතුරුදහන්වීම් සහ අනතුරු පිළිබඳ වාර්තා
- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
    - ජනගහණය, සමාජ-ආර්ථික දත්ත
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
    - කෘෂිකාර්මික හානි පිළිබඳ තොරතුරු
- රතු කුරුස සංවිධානය
    - ආපදා සහන හා ජනතාවට ඇති වූ සමාජ බලපෑම් පිළිබඳ තොරතුරු
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
    - ආපදා වාර්තා, හානි වාර්තා
- මධ්‍යම පරිසර අධිකාරිය
- නාරා ආයතනය (ජාතික ජලජ සම්පත් පර්යේෂණ ආයතනය)
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
    - ආපදා වාර්තා, හානි වාර්තා, හානි වූ ප්‍රදේශ, අවදානම් ප්‍රදේශ

(මෙවැනි මූලාශ්‍ර තුනක් නිදසුන් සහිත ව විස්තර කිරීමට විස්තරයට ලකුණු 1 ½ + නිදසුන් දැක්වීමට ලකුණු ½ ලකුණු 2 බැගින් - ලකුණු 6)

04. i. දුරස්ථ සංවේදය යනු කුමක් දැයි හඳුන්වන්න.

- යම්කිසි වස්තුවක් හෝ ක්‍රියාකාරිත්වයක් හෝ වෙත භෞතික ව ළඟා නොවී දුර සිට හඳුනා ගැනීම, අධ්‍යයනය කිරීම, වටහා ගැනීම හා විශ්ලේෂණය කිරීමේ තාක්ෂණය දුරස්ථ සංවේදය යි.

(යනාදි නිවැරදි හැඳින්වීමකට ලකුණු ලබා දෙන්න - ලකුණු 2)

ii. දුරස්ථ සංවේද ක්‍රියාවලියේ පහත දැක්වෙන අවස්ථා **තුනෙහි** ක්‍රියාකාරිත්වය කෙටියෙන් විස්තර කරන්න.

a. ශක්ති ප්‍රභවය

- දුරස්ථ සංවේදය මගින් වස්තුව හෝ ක්‍රියාකාරිත්වය ග්‍රහණය කර ගැනීමට නම් පළමුව එය හඳුනා ගැනීම සිදු කළ යුතුය. මේ සඳහා ශක්තිය හා ආලෝකය අවශ්‍ය වන අතර ආලෝකය නිපදවන ශක්ති මූලාශ්‍රයක් අවශ්‍ය වේ. එහි දී ස්වභාවික ශක්ති මූලාශ්‍රයක්වූ සූර්යයා මගින් දහවල් කාලය තුළ දී දුරස්ථ සංවේද ක්‍රියාවලියට අවශ්‍ය ආලෝකය හා ශක්තිය ලබා ගනිමින් දත්ත ලබා ගනී. එය අක්‍රීය සංවේදය ලෙස හඳුන්වයි. එසේ ම රාත්‍රී කාලයේ දී සංවේදක උපකරණ මත සවිකරන ලද කෘත්‍රිම ශක්ති මූලාශ්‍රයක් භාවිත කරමින් දත්ත ලබා ගනී. මෙය සක්‍රීය සංවේදය ලෙස හඳුන්වයි.

b. ඉලක්කය හෝ වස්තුව

- දුරස්ථ සංවේද තාක්ෂණයේ අරමුණ වන්නේ පෘථිවිය මත පවතින කිසියම් වස්තුවක් හෝ රූපමිතියක දත්ත ස්වරූපයෙන් ග්‍රහණය කර ගැනීමයි. එය සිදු කරනු ලබන්නේ මූලික වශයෙන් පෘථිවිය මත පවතින වස්තූන් විසින් ශක්තිය පරාවර්තනය හා විමෝචනය කිරීමේ ප්‍රමාණය හා ස්වභාවය මතයි. පෘථිවිය මත පවතින වස්තූන්ගේ ශක්තිය පරාවර්තනය කිරීම, විමෝචනය කිරීම එකිනෙකට හාත් පසින්ම වෙනස්ව සිදු වේ. මේ සඳහා එම වස්තුවේ හැඩය, ස්වභාවය, වර්ණය වැනි බොහෝ සාධකයන් හේතු වේ. මෙම වෙනස් වීම සංවේද උපකරණ මගින් වෙන් කොට හඳුනා ගෙන, අංකිත දත්ත ස්වරූපයෙන් පටිගත කරගනු ලබයි.

c. විශ්ලේෂණය

- දුරස්ථ සංවේද ක්‍රියාවලිය මගින් ලබා ගන්නා දත්ත විවිධ භෘදුකාංග භාවිතයෙන් විශ්ලේෂණය හා විවරණය කිරීම සිදු කරයි. එහිදී නව සිතියම් විද්‍යාත්මක ක්‍රමයක් වන භෘදුකාංග (GIS/RS භෘදුකාංග) බහුල වශයෙන් භාවිත කරයි. ගැටලුව විසඳීම සඳහා අවශ්‍ය දත්ත සම්පාදනය කර ගැනීමට මෙමගින් හැකියාවක් ලැබේ. අවශ්‍යතාව අනුව භාවිත කරන විශ්ලේෂණ ක්‍රමවේද හා භෘදුකාංග වෙනස් කරගත හැකිය.

(අවස්ථා තුන කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 3)

iii. ගුවන් ඡායාරූප තාක්ෂණයේ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න.

- නිශ්චිත පියාසර සැලසුමක් මත ලබා ගනී
- ඡායාරූප ලබා ගන්නා කෝණය මත ගුවන් ඡායාරූප වර්ග 02 ක් ඇත (සිරස් හා ඇල ගුවන් ඡායාරූප)
- සැබෑ භූමියේ යථා ස්වරූපය දක්වන ඡායාරූපයක් වේ
- ආවරණය කරන ප්‍රදේශය අවශ්‍යතාවය මත තීරණය වේ
- අතිව්ශාදනය වන ආකාරයෙන් ඡායාරූප ලබා ගනී
- ත්‍රිමාන දත්ත ලබා ගත හැකි ය
- ගුවන් යානා, හෙලිකොප්ටර් හෝ ඩ්‍රෝන භාවිතා කරමින් භූමිය ඉහළින් ඡායාරූප ගනී
- කෙටි කාලයකින් විශාල භූමි ප්‍රදේශයක් එකවර පෙන්වීමට/ආවරණය කිරීමට හැකියාව ඇත
- සිතියම් නිර්මාණය, නගර සැලසුම්, කෘෂිකර්ම, පරිසර අධ්‍යයනය වැනි කටයුතු සඳහා භාවිතා වේ

(යනාදී ලක්ෂණ දෙකක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 4)

iv. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා නව සිතියම් විද්‍යාත්මක ක්‍රම-ශිල්ප යොදා ගත හැකි අවස්ථා **තුනක්** නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.


- ත්‍රිමාණ සිතියම් හා අතථ්‍ය චාරිකා (Virtual Trip) සහිත සිතියම් නිර්මාණය කිරීම
- දුරකථන යෙදුම් සහිත සජීවී සිතියම් නිර්මාණය කිරීම
- සංචාරක මග පෙන්වීම් සහිත සිතියම් නිර්මාණය
- සංචාරක කර්මාන්තයට අවශ්‍ය පහසුකම් සංවර්ධනය හා සැළසුම් සඳහා අවශ්‍යය දත්ත ලබා ගැනීම හා සිතියම් නිර්මාණය
- සංචාරක ආකර්ෂණ ස්ථාන සිතියම් කිරීම (පුරාවිද්‍යා ස්ථාන, ජාතික උද්‍යානය, වෙරළ, දිය ඇලි වැනි)
- නව සංචාරක කලාප හඳුනා ගැනීම
- මාර්ග හා ප්‍රවේශ පහසුකම් සැලසුම් කිරීම
- ඩිජිටල් සහ අන්තර්ක්‍රියාකාරී සිතියම් සකස් කිරීම
- ප්‍රචාරණ සහ ප්‍රදර්ශන සඳහා භාවිතය
- සංචාරක දත්ත විශ්ලේෂණය
- සංචාරක සම්පත් කළමනාකරණය

(මෙවැනි අවස්ථා තුනක් නිදසුන් සහිතව පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5. i. දත්ත වගුව 1 භාවිත කර **බහු-තීරු ප්‍රස්තාරයක්** නිර්මාණය කරන්න.

කලාප අනුව ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීම (දහස්) (2021 - 2024)



මූලාශ්‍රය:- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2025

මාතෘකාව		ලකුණු 0.5
මූලාශ්‍රය		ලකුණු 0.5
x අක්ෂය		ලකුණු 01
y අක්ෂය		ලකුණු 01
සූචකය		ලකුණු 01
තීරු	නිවැරදි බව	ලකුණු 03
	සමස්තය	ලකුණු 01
		(ලකුණු 08)

ii. ඔබ විසින් නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරින් කලාපීය මට්ටමින් සංචාරකයින්ගේ පැමිණීමේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

- සෑම කලාපයක ම සංචාරක පැමිණීම් වසරෙන් වසර වැඩි වීමක් ඇත
- ආසියා-පැසිෆික් කලාපය අඛණ්ඩව ඉහළ ම සංචාරකයන්ගේ පැමිණීමක් පෙන්වයි
- යුරෝපය දෙවන ස්ථානයේ පසු වන නමුත් 2021 සිට 2024 දක්වා වේගයෙන් වැඩි වීමක් දක්වයි
- ඇමරිකා සහ මැදි පෙරදිග කලාපවල සංඛ්‍යාත්මක වර්ධනයක් සාමාන්‍යයෙන් නිරීක්ෂණය කළ හැක
- 2021 සිට 2024 දක්වා සම්පූර්ණ සංචාරක සංඛ්‍යාව දෙගුණයට ආසන්න ව වැඩි වී ඇත
- මැද පෙරදිග කලාපය තුළ සංචාරක පැමිණීම් අනෙක් කලාපවලට වඩා අඩු ය
- 2023 සහ 2024 වසරවල සියලු කලාපවල සංචාරක පැමිණීම් වඩාත් වේගයෙන් වර්ධනය වී ඇත

(යනාදී ලක්ෂණ හතරක් සඳහන් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 4)

iii. නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරින් බහු තීරු ප්‍රස්තාර ක්‍රමයේ වාසි **දෙකක්** විස්තර කරන්න.

- එක ම ප්‍රස්තාරයකින් කණ්ඩායම් කිහිපයක් අතර සංසන්දනය පහසුවෙන් කළ හැක
- වර්ෂ කිහිපයක හෝ කාණ්ඩ කිහිපයක වෙනස්කම් පැහැදිලිව පෙන්වයි
- දත්ත පැහැදිලිව හා දෘශ්‍යමය ලෙස ඉදිරිපත් කළ හැක
- විශාල දත්ත ප්‍රමාණයක් සරල ව සකස් කර පෙන්වීමට පහසු ය
- වර්ධනය හෝ අඩු වීම පහසුවෙන් හඳුනා ගත හැක
- සිසුන්ට හෝ පර්යේෂකයන්ට දත්ත ඉක්මනින් තේරුම් ගැනීමට උපකාරී වේ
- කලාප, වර්ෂ, කාණ්ඩ අතර වෙනස්කම් එකවර ම බැලිය හැක

(බහු තීරු ප්‍රස්තාර ක්‍රමයේ වාසි දෙකක් විස්තර කිරීමට ලකුණු 1½ බැගින් - ලකුණු 3)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

6.

i. **වගුව 2** හි ඇති දත්ත අනුව මහ කන්නයේ වාර්ෂික වී අස්වැන්න පහත ගණනය කිරීම් සිදු කරන්න.

a. මධ්‍යන්‍යය
b. අපගමනය
c. මධ්‍යන්‍යය අපගමනය

$MD = \frac{\sum |x-\bar{x}|}{n}$ සූත්‍රය භාවිත කරන්න

වර්ෂය	නිෂ්පාදනය (මෙ.ටො - දහස්) x	$\bar{x}$ (a.)	$x - \bar{x}$ (b.)
2016	2,903	$\frac{\sum x}{n}$ 2620	283
2017	1,474		- 1,146
2018	2,397		- 223
2019	3,072		452
2020	3,197		577
2021	3,062		442
2022	1,931		- 689
2023	2,696		76
2024	2,722		102
2025	2,746		126
	$\sum x = 26{,}200$		(c.) $\sum\|x - \bar{x}\| = 4116$

a. මධ්‍යන්‍යය

$\bar{x} = \frac{\sum x}{n}$

$\bar{x} = \frac{26200}{10} = 2620$

c. මධ්‍යන්‍යය අපගමනය


$MD = \frac{\sum |x - \bar{x}|}{n}$

MD = $\frac{4116}{10} = 411.6$

a. මධ්‍යන්‍යය	ලකුණු 01
b. අපගමනය	ලකුණු 02
c. මධ්‍යන්‍යය අපගමනය	ලකුණු 02
	(ලකුණු 05)

(ii). ඉහත (i) හි දත්ත වගුව ඇසුරින් **අපගමන ප්‍රස්තාරයක්** නිර්මාණය කරන්න.

මහ කන්නයේ වී නිෂ්පාදනය (මෙ.ටො. දහස්) 2016 - 2025



මූලාශ්‍රය:- ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2025

මාතෘකාව	ලකුණු 0.5
මූලාශ්‍රය	ලකුණු 0.5
x අක්ෂය	ලකුණු 01
y අක්ෂය	ලකුණු 01
තීරුවල නිවැරදි බව	ලකුණු 02
සමස්තය/වර්ණ භාවිතය	ලකුණු 01
	(ලකුණු 06)

(iii). ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ඇසුරින් ශ්‍රී ලංකාවේ මහ කන්නයේ වාර්ෂික වී නිෂ්පාදනයේ විචලතාවය පිළිබඳ කරුණු **හතරක්** දක්වන්න.

- විචලතාවය ඉහළ මට්ටමේ පවතී – වසරෙන් වසර වී නිෂ්පාදනය ස්ථාවර නොවී උච්චාවචනය වී ඇත
- ලබාදී ඇති කාලසීමාවේ අඩුම අගය 2017 වර්ෂයේ දී වාර්තා වේ
- 2019-2021 කාලයේ වර්ධන ප්‍රවණතාවයක් – මෙම වසර තුන තුළ වී නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත
- 2020 වසරේ ඉහළම ධනාත්මක විචලතාවය – එම වසරේ වී නිෂ්පාදනය වැඩිම වර්ධනයක් පෙන්වයි
- 2023, 2024 හා 2025 වසරවල වී නිෂ්පාදනය නැවත වර්ධනය වන ප්‍රවණතාවයක් දක්නට ලැබේ
- 2017 හා 2022 වසරවල දී ඉතා විශාල පහළ යාම් දක්නට ලැබේ
- මෙම කාලය තුළ වී නිෂ්පාදනය අස්ථාවර වූ නමුත් 2023ට පසුව යථා තත්ත්වයට පැමිණෙන ප්‍රවණතාවයක් පෙන්වයි
- ශ්‍රී ලංකාවේ 2016-2015 සාමාන්‍ය වී අස්වැන්නේ විචලතාව +600 ත් -1200 ත් අතර පවතී

(යනාදී කරුණු හතරක් ප්‍රස්තාරය ඇසුරින් දැක්වීමට ලකුණු 1 බැගින් - ලකුණු 4)
(වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා නොදෙන්න)

❋ ❋ ❋ ❋

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Advanced Level) Supportive Assessment, 2026

භූගෝල විද්‍යාව - II - (පිළිතුරු පත්‍රය)
புவியியல - II - (விடைப்பத்திரம்)
Geography - II - (Answer Sheet)

22 S II

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01).

i. භෞතික පද්ධතියක ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

- ව්‍යුහයකට අනුව සැකසී තිබීම
- සංරචක අතර අන්තර් සබඳතා පැවැත්වීම
- උප පද්ධතිවලින් සමන්විත වීම
- උප ලක්ෂණ හා ද්‍රව්‍ය සමූහයක එකතුවක් වීම
- සූර්ය ශක්තිය මත ක්‍රියාත්මක වීම

(යනාදි ලක්ෂණ දෙකක් නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු2)

ii. ශිලාගෝලීය පද්ධතියේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- ප්‍රධාන ස්ථර දෙකකින් සමන්විත වීම (කබොල හා ඉහළ ප්‍රාවරණය)
- සිලිකා, ඇලුමීනියම්, මැග්නීසියම් වැනි රසායනික මූලයන් ප්‍රධාන වශයෙන් සමන්විත වීම
- විවිධ ක්‍රියාවලි හා සංසිද්ධි ශිලාගෝලය තුළ සිදු වීම. (තැටි චලනය, ගිණිකඳු ඇති වීම, පස නිර්මාණය, පාෂාණ නිර්මාණය, ඛනිජ නිර්මාණය වැනි)
- විවිධ උප පද්ධති හා සංරචක රාශියකින් යුක්ත වීම (පස, පාෂාණ, ඛනිජ . . . වැනි)
- අභ්‍යන්තර ව්‍යුහය අනුව සණ තත්ත්වයේ පවතින ද්‍රව්‍ය වලින් සමන්විත වේ
- එකිනෙකට වෙන් වූ භූ තැටි ලෙස පිහිටා ඇත

(ලක්ෂණ තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු6)

iii. පහත උප පද්ධති ආශ්‍රිතව දක්නට ලැබෙන ස්වාභාවික ක්‍රියාවලි **එක** බැගින් සාකච්ඡා කරන්න.

a. ජලගෝලය b. වායුගෝලය c. ජෛවගෝලය

a. ජලගෝලය
   - ජල චක්‍රය
   - සාගරික දියවැල් සංසරණය
   - ගංගා ක්‍රියාවලිය
   - ග්ලැසියර් ක්‍රියාවලිය

b. වායුගෝලය
   - වායුගෝලීය සුළං සංසරණය ක්‍රියාවලි
   - හරිතාගාර ආවරණය
   - ඕසෝන් ස්ථර මඟින් අහිතකර පාරජම්බුල කිරණ අවශෝෂණය කර ගැනීම
   - පරිසර පතන සීඝ්‍රතාවය සිදුවීම

c. ජෛවගෝලය
   - ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය
   - ජෛව භූ රසායන චක්‍ර හුවමාරු වීම (කාබන්, නයිට්‍රජන්, පොස්පරස්)
   - ආහාර දාම හා ආහාර ජාල මත ශක්තිය ගලා යෑමේ ක්‍රියාවලි
   - වියෝජන ක්‍රියාවලිය

(යනාදි වශයෙන් ක්‍රියාවලි විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු6)

iv. පාරිසරික සමතුලිතතාව බිඳ වැටෙන භෞතික හා මානව ක්‍රියාවලි **තුනක්** පැහැදිලි කරන්න.

- භෞතික ක්‍රියාවලි
  - ගෝලීය උණුසුම ඉහළ යෑම
  - යමහල් විදාරණය
  - භූමිකම්පා ඇති වීම
  - සුනාමි ඇති වීම
  - සුළි සුළං ඇති වීම
  - ලැව්ගිනි ඇති වීම
  - ආක්‍රමණශීලී සත්ත්ව හා ශාකවල ක්‍රියාකාරීත්වය

- මානව ක්‍රියාවලි
  - වනහරණය
    (කෘෂිකර්මාන්ත ජනාවාස ඉදි කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා වන විනාශය)
  - පරිසර දූෂණය
    (කර්මාන්තශාලා / පොසිල ඉන්ධන දහනය මත වායු දූෂණය හා රසායනික ද්‍රව්‍ය භාවිතය මත භූමි හායනය)
  - නාගරීකරණය හා කාර්මීකරණය
  - සම්පත් අනිසි ලෙස භාවිතය
  - සතුන් දඩයම් කිරීම
  - කසළ නිසි පරිදි බැහැර නොකිරීම
  - කෘෂිකාර්මික කටයුතුවල දී
  - ගංගා හරස් කර ජලාශ ඉදි කිරීම

(ක්‍රියාවලි තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

02). i. ග්ලැසියර් ආශ්‍රිත ඛාදන ක්‍රියාවලි **දෙකක්** නම් කරන්න.

- උත්පාටනය
- උල්ලේඛය
- පිරිසැරීම

(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු2)

ii. ඇල්පයින් ග්ලැසියර් ආශ්‍රිත ඛාදිත භූ රූප **තුනක** නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න.




(ඛාදිත භූ රූප තුනක් රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iii. මහතලා ග්ලැසියර් ආශ්‍රිත නිධිසාදිත භූ රූප **තුනක්** රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න.

- අකුරු මැටි
- ඩ්‍රම්ලින් (බිජු පැසි)
- එස්කර්
- කේම
- අගම්ගල්
- හෙබ





(මහතලා ග්ලැසියර් නිධිසාදිත භූ රූප තුනක් නිවැරදි ව ඇඳ විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iv. වර්තමානයේ ග්ලැසියර් ආශ්‍රිත ප්‍රදේශ මුහුණ පා ඇති ගැටලු **තුනක්** විස්තර කරන්න.

- ග්ලැසියර් දිය වීමත් සමඟ භූ දර්ශනය වෙනස් වීම
- ග්ලැසියර් ආශ්‍රිත පරිසර පද්ධති විනාශ වීමේ තර්ජනයකට ලක් වීම
- ජෛව විවිධත්වය හායනය වීම
- උපද්‍රව තත්ත්වයන්ගේ වර්ධනය (හිමකදු කඩා වැටීම්, ගංවතුර තත්ත්වයන්, පිළිවාසුළි)
- ආගන්තුක පරිසර පද්ධති වර්ධනය වීම
- මීතේන් වැනි විෂ වායූන් වායුගෝලයට නිකුත් වීමේ තර්ජන ඇති වීම

(යනාදී ගැටලු තුනක් විස්තර කිරීමට ලකුණ 2 බැගින් - ලකුණු 6)

03). i. පෘථිවිය මතුපිට ජල ව්‍යාප්තිය හා සම්බන්ධ මෙම සටහනෙ හි A හා B නම් කරන්න.

A - විල් / අභ්‍යන්තර මිරිදිය ජලාශ
B - වායුගෝලීය ජලය / ජල වාෂ්ප

(නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)

ii. ජලය සම්පතක් වීමට බලපාන සාධක **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

- වැඩිවන ජන සංඛ්‍යාව අනුව ජල අවශ්‍යතාවේ ප්‍රමාණය ඉහළ යාම
- නාගරික ප්‍රදේශවල අධික ජල පරිභෝජනය
- කෘෂිකාර්මික හා කාර්මික කටයුතුවල දී අපද්‍රව්‍ය අක්‍රමවත්ව බැහැර කිරීම
- පොහොර සහ කෘෂි රසායන භාවිතයෙන් ජලයට විවිධ රසායන ද්‍රව්‍ය එකතු වීම
- සත්ත්ව අපද්‍රව්‍ය මුසු වීම නිසා ජලය දූෂණය වීම
- විවිධ ආකර කර්මාන්ත කටයුතු නිසා ජල මූලාශ්‍ර වෙනස් වීම
- ස්වාභාවික ආපදා හේතුවෙන් ජල මූලාශ්‍ර වෙනස් වීම හා විනාශ වීම

(සාධකයක් විස්තර කිරීමට ලකුණු 1½ +
උදාහරණ දැක්වීමට ලකුණු ½
සාධක තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iii. සාගර ජලය භාවිතයෙන් සිදු කරන ආර්ථික කටයුතු **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- මසුන් ඇල්ලීම
- ජලජ කෘෂිකර්මාන්තය / මත්ස්‍ය වගාව (Aquaculture)
- ලුණු නිෂ්පාදනය
- ප්‍රවාහන හා වරාය සේවා
- සංචාරක කර්මාන්තය
- ඛනිජ සම්පත් ලබා ගැනීම
- සාගර ජලයෙන් ඖෂධ හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය
- මුහුදු රළ මගින් විදුලි බලය නිෂ්පාදනය

(වැනි ආර්ථික කටයුතු තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iv. ගෝලීය වශයෙන් පවතින ජල ගැටලු අවම කිරීමට විවිධ රටවල් භාවිත කරන නව ක්‍රමවේද **තුනක** යෝග්‍යතාව පැහැදිලි කරන්න.

- මුහුදු ජලය පානීය ජලය බවට පිරිපහදු කිරීම
- වර්ෂා ජලය එකතු කිරීම හා භාවිතය
- ජලය නැවත ප්‍රතිචක්‍රීකරණය කිරීම
- බිංදු ජල තාක්ෂණ හා විසිරි ජල සම්පාදන ක්‍රම භාවිතය
- සුහුරු ජල කළමනාකරණ පද්ධති භාවිතය
- ජල සුරැකුම් තාක්ෂණයන් භාවිතය
- කෘෂිකර්මාන්තයේ දී ජල භාවිතය අඩු කරන නව බීජ වර්ග භාවිතය
- ජල ගබඩා ව්‍යාපෘති හා කෘත්‍රිම ජලාශ ඉදිකිරීම
- භූගත ජල සම්පත් ආරක්ෂා කිරීම
- ජල දූෂණය පාලනය කිරීම සඳහා නව පිරිසිදු කිරීමේ තාක්ෂණයන් භාවිතය
- වායුගෝලීය ජල වාෂ්ප / මීදුම තුළින් ජලය ලබා ගැනීමේ ක්‍රම භාවිතය

(යනාදි ක්‍රමවේද තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

04). i. උණුසුම් කාන්තාර හා ශීත කාන්තාර දෙක බැගින් නම් කරන්න.

ශීත කාන්තාරය		උෂ්ණ කාන්තාරය
ඇන්ටාක්ටික් ආක්ටික් ගෝබි තක්ලමකාන් කරාකුම් කිසිල්කුම් පැටගෝනියානු මහා ද්‍රෝණි/ග්‍රේට් බේසින් අටකාමා (ගූ.මා.දේ.සං. අනුව)		සහරා අරාබි රුබ් අල් ඛාලි තාර් කලහාරි නැමීබ් සොනොරන් මොහාවි චිහුවාහුවාන්/ශිෂුවාන් මහා වික්ටෝරියා මහා වාලුකා සිම්ප්සන් අටකාමා (පිහිටීම හා ස්වභාවය අනුව)

(උෂ්ණ කාන්තාර දෙකක් නම් කිරීමට ලකුණු ½ බැගින් ලකුණු 1 +
ශීත කාන්තාර දෙකක් නම් කිරීමට ලකුණු ½ බැගින් ලකුණු 1
ලකුණු 2)

ii. කාන්තාර බියෝම පද්ධතියේ ලක්ෂණ **තුනක්** පහත සාධක යටතේ විස්තර කරන්න.

a. ව්‍යාප්තිය b. දේශගුණය c. වෘක්ෂලතා

(a) ව්‍යාප්තිය
- ලෝකයේ බිම් ප්‍රමාණයෙන් 20%ක් පමණ කාන්තාර වේ
- උතුරු හා දකුණු අක්ෂාංශ 20^0- 35^0 අතර කලාපයේ උෂ්ණ කාන්තාර ව්‍යාප්ත ව ඇත
- මහාද්වීපයන්හි මධ්‍යයට වන්නට පිහිටයි
- අප්‍රිකාවේ සහරා හා කලහාරි, අරාබි කාන්තාරය, මහා ඕස්ට්‍රේලියානු කාන්තාරය උෂ්ණ කාන්තාර වේ
- ආසියාවේ ගෝබි, ඇන්ටාක්ටිකා, ග්‍රීන්ලන්තය දකුණු ඇමරිකාවේ ඇටකාමා ශීත කාන්තාර ය

(b) දේශගුණය
- උෂ්ණ කාන්තාරවල වාර්ෂික වර්ෂාපතනය මි.මී. 150ක් තරම් අඩු ය
- වර්ෂය පුරා ඒකාකාරී උෂ්ණත්වයක් පවති. එය සෙල්සියස් අංශක 20-25 තෙක් වේ. සමහර අවස්ථාවල අස්ථායී උෂ්ණත්වයක් පවතී. සෙල්සියස් අංශක 43-49 තෙක් විය හැකි ය
- දෛනික උෂ්ණත්ව අන්තරය ඉහළ අගයක් ගනී
- වියළි වායුගෝලයක් සහිත ය
- දිවා රාත්‍රී දෙකෙහි ම වියළි සුළං හමයි
- ශීත කාන්තාරවල ශීත ඍතුවේ උෂ්ණත්වය සෙල්සියස් අංශක (-2) සිට (-4) තෙක් වන අතර ග්‍රීෂ්ම ඍතුවේ දී සෙල්සියස් අංශක 21-26 තෙක් විය හැකි ය
- හිමෙන් වැසී පවතී. වසන්තයේ වර්ෂාපතනය ලැබේ. මි.මී. 150 - 260 තෙක් ය

(c) වෘක්ෂලතා
- ශාක වැස්ම පැතිරී නැත
- ක්ෂේම භූමි හා වැසි ලැබෙන තැන් ආශ්‍රිත ව සුළු ශාක වැස්මක් පවතී
- පවතින ශාක ප්‍රජාව අඩු ආර්ද්‍රතාව හා ශුෂ්කතාවයට හොඳින් අනුවර්තනය වී ඇත
- එබැවින්:
  - සිහින් පත්‍ර දැරීම
  - පත්‍ර පතනය
  - පත්‍ර ඉටි වැස්ම සහිත වීම
  - දිගු මුල් පද්ධතිය
  - කටු සහ යුෂ සහිත බව
  - මාංසල කඳන් දැරීම ආදිය ශාකවල විශේෂ ලක්ෂණ ය.
- ශාක විශේෂ:
  - පතොක්, කාන්තාර අයන් වුඩ්, කෝමාරිකා, කටු පඳුරු, පෙඳ පාසි

(විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iii. වර්තමානයේ කාන්තාරීකරණය වර්ධනය කිරීමට හේතු වී ඇති මානව ක්‍රියාකාරකම් **තුනක්** විස්තර කරන්න

- වනහරණය වෙගවත් වීම : කෘෂිකාර්මික කටයුතු, ජනාවාස ඉදිකිරීම සහ දැව අවශ්‍යතා සඳහා මහා පරිමාණයෙන් වනාන්තර හෙළි කිරීම නිසා පාංශු බාදනය ඉහළ ගොස් භූමිය ශුෂ්ක බවට පත් වේ
- විශාල වශයෙන් සිදු කරන සත්ත්ව පාලනය - තණබිම්වල සීමාව ඉක්මවා සතුන් ලවා තණකොළ සහ කුඩා ශාක ආහාරයට ගැනීමට සැලැස්වීම නිසා ශාක වැස්ම විනාශ වී පාංශු ස්ථරය නිරාවරණය වේ
- අවිධිමත් කෘෂිකාර්මික පිළිවෙත්: භූමියේ සාරවත් බව නොසලකා අධික ලෙස රසායනික පොහොර භාවිතය, එකම භෝගය දිගින් දිගටම වගා කිරීම සහ අවිධිමත් ජල සම්පාදනය (පාංශු ලවණතාව ඉහළ යාම) නිසා සාරවත් බිම් කාන්තාර බවට පත් වේ.
- භූගත ජලය අධික ලෙස භාවිත කිරීම: කෘෂිකර්මාන්තයට සහ කර්මාන්තශාලාවලට අවශ්‍ය ජලය ලබා ගැනීමට භූගත ජල මූලාශ්‍ර සීමාව ඉක්මවා ප්‍රයෝජනයට ගැනීම නිසා ජල මට්ටම පහත වැටී ශාකවලට අවශ්‍ය තෙතමනය අහිමි වේ.
- අක්‍රමවත්ව සිදු කරන පතල් කැණීම සහ නාගරීකරණය: මහා පරිමාණ පතල් කැණීම් නිසා භූමියේ ව්‍යුහය විනාශ වීමත්, නාගරීකරණය හේතුවෙන් ස්වභාවික ජල වහන පද්ධති අවහිර වීමත් පාංශු ගුණාත්මකභාවය පිරිහීමට හා කාන්තාරීකරණයට හේතු වේ.

(යනාදි ක්‍රියාකාරකම් තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු6)

iv. මෑත කාලයේ නිරන්තරයෙන් සිදු වන ජල ගැලීම් නිසා ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති මුහුණ පා ඇති ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න.

- ජෛව විවිධත්වය පිරිහීම සහ සත්ව වාසස්ථාන විනාශ වීම: දරුණු ජල පහරවල් නිසා වනාන්තරවල ඇති ශාක උදුරා දැමීම සහ කුඩා සතුන්ගේ වාසස්ථාන ජලයෙන් යට වීම සිදු වේ. මෙය විශේෂයෙන්ම ආවේණික සතුන්ගේ පැවැත්මට තර්ජනයකි.
- සාරවත් මතුපිට පස් තට්ටුව සේදී යාම (පාංශු බාදනය): ගංවතුර නිසා භූමියේ පවතින සාරවත් මතුපිට පස් තට්ටුව සේදී ගොස් ගංගා සහ වැව් පතුලේ තැන්පත් වේ.
- ආක්‍රමණශීලී ශාක ව්‍යාප්ත වීම: ජල ගැලීම් හරහා ජපන් ජබර වැනි ආක්‍රමණශීලී ශාකවල බීජ සහ කොටස් පරිසර පද්ධතිවලට එකතු විය හැකි ය. ජලය බැස ගිය පසු මෙම ශාක පරිසර පද්ධතිවල වේගයෙන් වර්ධනය වී දේශීය ශාක ප්‍රභාව යටපත් කරයි.
- ජලජ පද්ධති අවසාදිතයන්ගෙන් ගොඩවීම: පාංශු බාදනය නිසා ගලා එන මඩ සහ අවසාදිත තැන්පත් වීමෙන් ගංගා, වැව් සහ කලපු ගොඩ වේ. එමගින් ජලජ ජීවීන්ගේ පැවැත්මට මෙන්ම එම පද්ධතිවල ජලය රඳවා ගැනීමේ ධාරිතාවයට ද හානි සිදු වේ.
- කඩොලාන සහ වෙරළබඩ පද්ධතිවල සමතුලිතතාවය බිඳී යාම: ගොඩබිමෙන් ගලා එන අතිරික්ත මිරිදිය ජලය සහ අපද්‍රව්‍ය සාගරයට හා කලපුවලට එකතු වීම නිසා එම ප්‍රදේශවල ලවණතාවය වෙනස් වේ. මෙය කඩොලාන ශාකවල සහ වෙරළබඩ මත්ස්‍ය කර්මාන්තයේ පැවැත්මට අහිතකර ලෙස බලපායි.

(මෙවැනි ගැටලු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05).

(i). දරිද්‍රතාවෙහි බහුමාන ගති ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

- මුදල් සහ ද්‍රව්‍ය හිඟකම
- මන්දපෝෂණය
- රෝගාබාධ
- ඉහළ ළදරු මරණ
- පහළ ආයු අපේක්ෂාව
- අසරණභාවය

(මේවායින් දෙකක් නිවැරදිව දැක්වීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)

(ii). ලෝක දරිද්‍රතාවට බලපාන හේතු **තුනක්** පැහැදිලි කරන්න.

- දරිද්‍රතා රේඛාව කාලීන ව වෙනස් වීම
- දියුණු රටවල ක්‍රය ශක්තිය ඉහළ යෑම
- උද්ධමනය
- ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ඇතැම් දියුණු වෙමින් පවතින රටවල මුදල් අවප්‍රමාණ වීම
- අධික ජන සංඛ්‍යා වර්ධනය
- රටවල සම්පත් ව්‍යාප්තියේ ව්‍යාප්තියේ අසමානතාවය

(මෙවැනි හේතු තුනක් කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

(iii). රටක ආහාර සුරක්ෂිතතාව රඳා පවතින ප්‍රධාන අංශ **තුන** කෙටියෙන් පැහැදිලි කරන්න.

රටක ආහාර සුරක්ෂිතතාව ඇති වන්නේ ආහාර ලබා ගැනීමට හැකියාව මතයි. ඊට බලපාන හේතු 3කි.

- ආහාර ස්ථායිතාව
- තම කැමැත්ත අනුව ආහාර ලබා ගැනීමට ඇති හැකියාව
- ආහාර නිෂ්පාදනය, බෙදාහැරීම හා සැපයීම

මෙම කරුණු තුන කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුය.

(නම් කිරීමට ලකුණු ½ + පැහැදිලි කිරීමට ලකුණු 1½ - ලකුණු 2 බැගින් - ලකුණු 6)

(iv). ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න.

- දේශීය කෘෂි කර්මාන්තය වැඩිදියුණු කිරීම
- ගොවීන්ට නව තාක්ෂණය යන්ත්‍රෝපකරණ සහ බීජ ආදිය ලබා දීම
- ආහාර නිෂ්පාදන විවිධාංගීකරණය මගින් වෙළෙඳපොළ ආහාර ඉල්ලුමට සරිලන සැපයුමක් ඇති කිරීම
- ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීමේ දී හා ප්‍රවාහනයේ දී සිදු වන නාස්තිය අවම කිරීමට කටයුතු කිරීම
- ගෘහස්ථ වගා ක්‍රම ප්‍රවලිත කිරීම
- අත්‍යවශ්‍ය ම ආහාර ද්‍රව්‍යවල මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීම
- ආහාර ආනයන ක්‍රියාවලිය කළමනාකරණය මගින් දේශීය ගොවියා ආරක්ෂා වීම හා ආහාර නිෂ්පාදනයට වැඩි වශයෙන් යොමු වීම
- කෘෂි බිම් ප්‍රසාරණය

(යනාදි ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

06).

(i). පෙට්‍රෝලියම් ආශ්‍රිත අතුරු නිෂ්පාදන **දෙකක්** නම් කරන්න.

- රසායනික පොහොර
- ලිහිසි තෙල්
- ප්ලාස්ටික්
- ආලේපන
- තාර
- කෘත්‍රිම රබර්
- කෘත්‍රිම රෙදි
- ඖෂධ
- පැරෆින් ඉටි

(මේවායින් දෙකක් නිවැරදිව දැක්වීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)

(ii). මෙම වගුවට අනුව 2024-2026 කාලය තුළ ගෝලීය පෙට්‍රෝලියම් නිෂ්පාදනයේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න.

- මුළු නිෂ්පාදනයේ ක්‍රමික වර්ධනය වීම. 2020 වසරේ පැවති 75.8 ක මුළු නිෂ්පාදනය 2025 වන විට 85.4 දක්වා වසරින් වසර අඛණ්ඩව ඉහළ ගොස් ඇත.
- සමස්ත කාලසීමාව පුරාම වැඩිම නිෂ්පාදනයක් සිදු කර ඇත්තේ මැදපෙරදිග කලාපයයි. 2025 වන විට එහි නිෂ්පාදනය 30.6 ක් ලෙස සටහන් වේ
- මැදපෙරදිගට පසුව දෙවනුවට වැඩිම නිෂ්පාදනයක් කරන්නේ උතුරු ඇමරිකාවයි. 2020 දී 24.2 ක් වූ එහි අගය 2025 වන විට 28.9 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත
- අනෙකුත් කලාප හා සසඳන විට ලතින් ඇමරිකාවේ නිෂ්පාදනය සාපේක්ෂව වේගයෙන් වර්ධනය වී ඇත (5.9 සිට 7.7 දක්වා)
- සෙසු ආසියානු කලාපයේ නිෂ්පාදනය පහත වැටීම දැකිය හැකි ය. වගුවේ දැක්වෙන එකම පසුබෑම් පෙන්වන කලාපය මෙයයි. 2020 දී 3.4 ක් වූ නිෂ්පාදනය 2025 වන විට 3.0 දක්වා අඩු වී ඇත
- යුරෝපයේ නිෂ්පාදනය වසර කිහිපයක් තිස්සේ 3.2 - 3.5 අතර පරාසයක පවතිමින් ඉතා මන්දගාමී හෝ ස්ථාවර ස්වරූපයක් පෙන්නුම් කරයි
- චීනය 2020 දී 3.9 සිට 2025 වන විට 4.4 දක්වා සිය නිෂ්පාදනය ක්‍රමයෙන් ඉහළ නංවා ගෙන ඇත

(යනාදි ලක්ෂණ තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

(iii). පෙට්‍රෝලියම් නිෂ්පාදනය ආශ්‍රිතව ගෝලීය වශයෙන් පැන නැගී ඇති ගැටලු **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

- **ගෝලීය උණුසුම ඉහළ යාම සහ දේශගුණික විපර්යාස**

  පෙට්‍රෝලියම් දහනයේදී වායුගෝලයට විශාල වශයෙන් කාබන්ඩයොක්සයිඩ් (CO^2) වැනි හරිතාගාර වායු මුදා හැරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පෘථිවියේ උණුසුම ඉහළ යාම, ග්ලැසියර දියවීම සහ අක්‍රමවත් කාලගුණ රටා ඇති වීම බරපතල ගෝලීය ගැටලුවක් බවට පත්ව ඇත.

- **ක්ෂයවන සම්පත් මූලයක් වීම හා සීමිත සම්පතක් වීම**

  ඛනිජ තෙල් යනු පුනර්ජනනය කළ නොහැකි (Non-renewable) සම්පතකි. ලෝකයේ පවතින තෙල් සංචිත ශීඝ්‍රයෙන් ක්ෂය වෙමින් පවතින අතර, අනාගතයේදී බලශක්ති අර්බුදයකට මුහුණ දීමට සිදු වේ යැයි පවතින බිය නිසා ලෝකය විකල්ප බලශක්ති ප්‍රභවයන් වෙත යොමු වීමට සිදුව ඇත.

- **පරිසර දූෂණය සහ තෙල් කාන්දු වීම් (Oil Spills)**

  ඛනිජ තෙල් කැණීමේදී සහ නෞකා මගින් ප්‍රවාහනය කිරීමේදී සිදුවන අනතුරු නිසා සාගරයට තෙල් කාන්දු වීමෙන් සාගර ජීවීන් සහ වෙරළබඩ පද්ධති දැඩි ලෙස විනාශ වේ. එමෙන්ම පිරිපහදු කිරීමේ ක්‍රියාවලියේදී පරිසරයට අහිතකර රසායනික ද්‍රව්‍ය මුදා හැරේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- **භූ දේශපාලනික අස්ථාවරභාවය සහ යුද්මය ගැටලු**

  ලෝකයේ ප්‍රධාන තෙල් නිධි පිහිටා ඇත්තේ සීමිත රටවල් සංඛ්‍යාවක (විශේෂයෙන් මැදපෙරදිග) බැවින්, එම කලාපවල පවතින දේශපාලනික නොසන්සුන්තා මුළු ලෝකයේම තෙල් මිල කෙරෙහි බලපායි. මෙය රටවල් අතර ආර්ථික හා යුද්මය ගැටලු ඇති වීමට ද ප්‍රධාන හේතුවක් වේ.

- **මිල උච්චාවචනය හා සැපයුම් ඒකාධිපතීත්ව මත ඇති වන ආර්ථික බලපෑම**

  ඛනිජ තෙල් මිල ලෝක වෙළඳපොළ තුළ නිතර වෙනස් වීම නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයට දැඩි බලපෑම් එල්ල වේ. ප්‍රවාහන ව්‍යදම් ඉහළ යාම හරහා අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිල ඉහළ ගොස් ලෝක ආර්ථික අර්බුද පැන නැගීමට මෙය හේතු වේ.

(ගැටළුවක් විස්තර කිරීමට ලකුණු 1½ + උදාහරණ දැක්වීමට ලකුණු ½ ලකුණු 2 බැගින් - ලකුණු 6)

(iv). ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් භාවිතය සම්බන්ධ ගැටළු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න.

- **පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවලිත කිරීම**

  පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීම සඳහා සූර්ය බලශක්තිය (Solar Power), සුළං බලශක්තිය (Wind Power) සහ ජල විදුලිය වැනි ස්වාභාවික බලශක්ති ප්‍රභවයන් වෙත වැඩි අවධානයක් යොමු කිරීම. විශේෂයෙන් නිවාස සහ කර්මාන්තශාලා සඳහා සූර්ය පැනල පද්ධති හඳුන්වා දීම මගින් විදුලි උත්පාදනයට වැයවන ඛනිජ තෙල් ප්‍රමාණය අඩු කළ හැකිය.

- **පොදු ප්‍රවාහන පද්ධතිය නවීකරණය කිරීම**

  පුද්ගලික වාහන භාවිතය අවම කර ඉන්ධන පිරිමැසීම සඳහා කාර්යක්ෂම සහ සුවපහසු පොදු ප්‍රවාහන සේවාවක් (බස් සහ දුම්රිය) ස්ථාපිත කිරීම. විද්‍යුත් දුම්රිය (Electric Trains) සේවාවන් ආරම්භ කිරීම සහ බස් රථ සඳහා වෙනම මංතීරු වෙන් කිරීම මෙහිදී වැදගත් වේ.

- **විද්‍යුත් වාහන (Electric Vehicles) භාවිතය දිරිමත් කිරීම**

  පෙට්‍රල් සහ ඩීසල් වාහන වෙනුවට විද්‍යුත් මෝටර් රථ සහ යතුරුපැදි භාවිතය සඳහා ජනතාව උනන්දු කිරීම. මෙහිදී විද්‍යුත් වාහන ආනයන බදු සහන ලබා දීම සහ දිවයින පුරා විද්‍යුත් ආරෝපණ මධ්‍යස්ථාන (Charging Stations) ප්‍රමාණය ඉහළ නැංවීම මගින් පෙට්‍රෝලියම් ඉල්ලුම සැලකිය යුතු ලෙස පාලනය කළ හැකිය.

- **ඉන්ධන පිරිමැසුම්දායක තාක්ෂණයන් හඳුන්වා දීම**

  කර්මාන්තශාලා සහ වාහන සඳහා නවීන, ඉන්ධන පිරිමැසීම ඉහළ මට්ටමක පවතින එන්ජින් සහ යන්ත්‍රෝපකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීම. එමෙන්ම පවතින වාහනවල දුම් පරීක්ෂාව සහ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කිරීම මගින් අනවශ්‍ය ලෙස ඉන්ධන දහනය වීම වැළැක්විය හැකිය.

- **විදේශීය ඍජු ආයෝජන සහ දේශීය කැණීම්**

  ශ්‍රී ලංකාවේ සතු මන්නාරම ද්‍රෝණියේ ඇති බවට හඳුනාගෙන ඇති ස්වාභාවික වායු සහ ඛනිජ තෙල් නිධි කැණීම සඳහා විදේශීය ආයෝජන ලබා ගැනීම. එමගින් ආනයනික ඛනිජ තෙල් සඳහා වැයවන විශාල විදේශ විනිමය ප්‍රමාණය ඉතිරි කර ගැනීමටත්, බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීමටත් අවස්ථාව ලැබේ.

(යනාදී ක්‍රියාමාර්ග තුනක් සාකච්ඡා කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

PAST PAPERS WIKI

07).

i. ජාන තාක්ෂණය යනු කුමක් දැයි හඳුන්වන්න.

- DNA අණු වෙන් කිරීම ඔස්සේ එහි ජීවී විශේෂයක ජානයක් තවත් ජීවියෙකුට මුසු කර නව ජීවී ප්‍රභේදයක් බිහිකර ගැනීමයි.

(යනාදි නිවැරදි හැඳින්වීමකට ලකුණු 2)

ii. ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ජාන තාක්ෂණය භාවිත කිරීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් විස්තර කරන්න.

- රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් තොර ව පළිබෝධවලට ප්‍රතිරෝධී ශාක හා සතුන් වර්ධනය කිරීමේ හැකියාව
- පරිසරයට රසායනික ද්‍රව්‍යවලින් සිදු කරන හානිය අවම කර ගැනීමට හැකි වීම
- රෝගවලට ප්‍රතිරෝධී ශාක හා සතුන් නිර්මාණය කර ගැනීමේ හැකියාව
- ශාක හා සත්ත්ව නිෂ්පාදනයන් ප්‍රමාණාත්මක ව ඉහළ නැංවීම
- විවිධ පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙන ශාක හා සතුන් නිර්මාණය කර ගැනීම
- ශාකවල හා සත්ත්ව නිෂ්පාදනවල පෝෂණීයභාවය ඉහළ නැංවීම
- එළවළු හා පළතුරු අපතේ යාම වැළැක්වීමට හැකි වීම
- නිෂ්පාදන නැවුම් පෙනුමකින් පවත්වා ගැනීමට හැකි වීම

(යනාදි සුවිශේෂීතාවයන් තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iii. වර්තමානයේ ඵෙන්ද්‍රීය කෘෂිකර්මාන්තය කෙරෙහි ක්‍රමයෙන් නැඹුරු වීම සඳහා බලපා ඇති සාධක **තුනක්** විස්තර කරන්න.

- සෞඛ්‍ය ප්‍රතිලාභ ඉහළ පැවතීම
- පරිසර පද්ධතිය ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම
- ආහාරවල ගුණාත්මකභාවය සහ රසය ඉහළ පැවතීම
- පිරිවැය අවම කර ගැනීම, ආර්ථික වාසි හා ඉල්ලුම ඉහළ ඉල්ලුමක් පැවතීම
- තිරසාර කෘෂිකාර්මික ක්‍රමවේදයක් වීම
- රසායනික පොහොර සහ පළිබෝධ නාශක වලින් ඇති වන සෞඛ්‍ය හානිය
- පසෙහි සාරවත්භාවය අඩු වීම
- පරිසර දූෂණය අඩු කර ගැනීමට
- ජෛව විවිධත්වය අඩු වීම නිසා
- ආහාර ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ජනතාවගේ අවධානය වැඩි වීම
- දිගු කාලීන කෘෂි ස්ථායීභාවය අවශ්‍ය වීම
- ඵෙන්ද්‍රීය ආහාර සඳහා වෙළඳපොළ ඉල්ලුම වැඩි වීම
- රසායනික පොහොර මිල ඉහළ යාම
- පරිසර හිතකාමී කෘෂිකර්ම ප්‍රතිපත්ති ප්‍රවර්ධනය

(යනාදි සාධක තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iv. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදන අලෙවිකරණ ක්‍රියාවලියේ පවතින ගැටලු විසඳා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න.

- රජයේ මැදිහත්වීම සහ සහතික මිල ක්‍රමය ශක්තිමත් කිරීම
- ගබඩා පහසුකම් සහ නවීන තාක්ෂණය භාවිතය
- අතරමැදියන්ගේ බලපෑම අවම කිරීම සහ සමුපකාර ක්‍රමය දියුණු කිරීම
- සන්නිවේදන තාක්ෂණය සහ දත්ත පද්ධති භාවිතය
- අගය එකතු කළ නිෂ්පාදන (Value Addition) දිරිමත් කිරීම
- යෙදවුම් හා මූල්‍ය පහසුකම් සහනදායීව ලබා දීම
- නව තාක්ෂණික ක්‍රම භාවිතයෙන් අලෙවිකරණ පද්ධතිය දියුණු කිරීම
- ගොවීන්ට ණය සහ ආධාර ලබා දීම

(යනාදි ක්‍රියාමාර්ග තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

08.

i. කලාපීය සංවිධානයක් යන්න නිර්වචනය කරන්න.

ලෝකයේ විවිධ ප්‍රදේශවලට අයත් භූගෝලීය වශයෙන් බොහෝ දුරට සමාන ලක්ෂණ සහිත රටවල් එකතු වී තම රටවල ආර්ථික, සමාජීය, දේශපාලනික, තාක්ෂණික, ආරක්ෂක ආදී අංශවල ගැටලු, බාධක හා අභියෝග සඳහා ශක්තිමත්ව මුහුණ දීමට බිහි වී ඇති සංවිධාන වේ.

(යනාදී නිවැරදි නිර්වචනයකට ලකුණු 2)

ii. සාර්ක් (SAARC) සංවිධානයේ අරමුණු හා කාර්යය භාරයන් **තුනක්** විස්තර කරන්න.

- කලාපීය ජනතාවගේ සුභසිද්ධිය හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම මගින් දිළිඳුකම තුරන් කිරීම
- කලාපය තුළ ආහාර සුරක්ෂිතතාව සඳහා කෘෂිකාර්මික මධ්‍යස්ථානයක් හා ආරක්ෂිත ආහාර සංවිධානයක් බංග්ලාදේශයේ පිහිටුවීම
- ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා රාජ්‍ය මට්ටමේ නායකයින් තීරණවලට එළඹීම හා ත්‍රස්තවාදය වැළැක්වීමේ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
- ආර්ථික ප්‍රවර්ධනය හා සෞඛ්‍ය ගැටලු විසඳීම සඳහා ජපාන සාර්ක් විදේශ අරමුදල හා දකුණු ආසියානු සංවර්ධන අරමුදල මගින් මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබාදීම හා සහයෝගිතාව ඇති කිරීම
- වෙළෙඳ ගැටලු අවම කිරීම හා කලාපීය රටවල් අතර වෙළෙඳාම සම්බන්ධ කටයුතුවල ප්‍රවර්ධනයක් ඇති කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම

(කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iii. වර්තමානය වන විට සාර්ක් සංවිධානය මුහුණ පා ඇති අභියෝග **තුනක්** විස්තර කරන්න.

- වර්තමානයේ දී සාර්ක් සංවිධානය අපේක්ෂා කළ සහයෝගිතාව ගිලිහී යාමට පටන් ගෙන තිබීම. උදා: ඉන්දියාව හා පාකිස්ථානය අතර පවතින අර්බුදකාරී තත්ත්වය
- කලාපීය වශයෙන් සහයෝගී ව කටයුතු කිරීමට පෙළඹුණ ද රට රටවල් ස්වාධීන ව කටයුතු කිරීමට ඇතැම් අවස්ථාවල දී පෙළඹීම
- කලාපීය සහයෝගිතාවට වඩා ස්වාධීන ප්‍රතිපත්තිවලට මුල්තැන දීම: කලාපීය වශයෙන් ඒකාබද්ධව කටයුතු කිරීමට එකඟතාව පළ කර තිබුණද, ඇතැම් අවස්ථාවලදී රටවල් තම පටු ජාතික අරමුණු වෙනුවෙන් ස්වාධීන ව තීරණ ගැනීමට පෙළඹීම
- ත්‍රස්තවාදය සහ ආරක්ෂක තර්ජන: කලාපය තුළ ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා රාජ්‍ය නායක මට්ටමින් ගිවිසුම් පැවතියද, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී පවතින දේශපාලනික බාධා
- ආර්ථික අසමානතාව සහ වෙළෙඳ බාධා: කලාපීය රටවල් අතර පවතින වෙළෙඳ ගැටලු අවම කර ගැනීමට සහ ආර්ථික ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කරන පූර්ණ දායකත්වය සාමාජික රටවල් අතරින් නිසි පරිදි නොලැබීම
- දිළිඳුකම සහ මූල්‍ය සම්පත් හිඟකම: කලාපීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහ දිළිඳුකම තුරන් කිරීමට අවශ්‍ය කරන මූල්‍ය හා ද්‍රව්‍යමය ආධාර සපයා ගැනීමේදී බාහිර අරමුදල් (උදා: ජපාන සාර්ක් අරමුදල) මත යැපීමට සිදුවීම

(යනාදී අභියෝග තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

iv. සංවර්ධනය වෙමින් පවතින රටකට ආපදා කළමනාකරණය සඳහා ජාත්‍යන්තර සංවිධානවල දායකත්වය පිළිබඳ කරුණු **තුනක්** විස්තර කරන්න.

- හදිසි සහන සහ මානුෂීය ආධාර සැපයීම: ආපදාවක් සිදු වූ වහාම අවශ්‍ය වන ආහාර, ඖෂධ, පිරිසිදු පානීය ජලය සහ තාවකාලික නවාතැන් වැනි මූලික අවශ්‍යතා සපුරාලීමට මූල්‍යමය හා ද්‍රව්‍යමය දායකත්වය ලබා දීම
- පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහ තාක්ෂණික සහාය: සුනාමි, සුළි සුළං හෝ ගංවතුර වැනි ආපදා කල්තියා හඳුනා ගැනීමට අවශ්‍ය නවීන තාක්ෂණය, චන්ද්‍රිකා දත්ත සහ පූර්ව අනතුරු ඇඟවීමේ උපකරණ ලබා දීම මගින් ජීවිත හා දේපළ හානි අවම කිරීමට සහය වීම
- ආපදා අවදානම් අවම කිරීමේ පුහුණුව සහ දැනුම හුවමාරු කිරීම: ආපදාවලට මුහුණ දෙන ආකාරය පිළිබඳව ප්‍රාදේශීය නිලධාරීන්ට සහ ජනතාවට පුහුණුව ලබා දීම, සහ ආපදා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීම
- සෞඛ්‍ය ගැටලු විසඳීම සහ වසංගත පාලනය: ආපදාවලින් පසු ඇති විය හැකි බෝවන රෝග පාලනය කිරීමට අවශ්‍ය එන්නත්, වෛද්‍ය කණ්ඩායම් සහ සෞඛ්‍ය පහසුකම් සැලසීම සඳහා ජාත්‍යන්තර අරමුදල් සහ සහයෝගිතාව ලබා දීම
- පශ්චාත් ආපදා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය: විනාශ වූ මාර්ග, නිවාස සහ පාසල් වැනි යටිතල පහසුකම් යළි ගොඩනැඟීම සඳහා දිගුකාලීන සහන ණය හෝ ආධාර ලබා දීම මගින් රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහය වීම

(යනාදී කරුණු තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)

❋ ❋ ❋ ❋